**සාර්ථක සමාජ ව්‍යවසායකයෙක් වීමට මග - සමාජ ව්‍යවසායකයන්ගේ අත්පොත භාවිතා කිරීම තවත් පහසු කිරීම සඳහා මෙම උදාහරණ උපකාරී කරගත හැකිය.**

**සමාජ ව්‍යවසාය උදාහරණයː**

# බෆලෝ බයිසිකලය




බෆලෝ බයිසිකල්ස් යනු අප්‍රිකානු සමාජ ව්‍යවසායයකි. බෆලෝ බයිසිකල්ස් සමාජ ව්‍යවසායයේ පරමාර්ථය වනුයේ පාපැදිය මගින් අප්‍රිකානු රටවල ජීවත් වන මිනිසුන්ගේ ජීවිත හොඳ අතට පරිවර්තනය කිරීමයි. ඔවුන්ගේ සමාජ ව්‍යවසායයේ ලාභය මුළුමනින්ම යෙදවෙන්නේ එම පරමාර්ථය වෙනුවෙනි.

අප්‍රිකානු රටවල ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ස්වයංරැකියා නියුක්තිකයන්, සුළු ව්‍යවසායකයන්, ගොවීන්, සෞඛ්‍ය සේවකයන්, ගුරුවරුන් සහ පාසල් දරුවන් තම ව්‍යාපාර, රාජකාරි, අධ්‍යාපන සහ එදිනෙදා වැඩකටයුතු කර ගැනීමට ඉතා රළු මංමාවත් ඔස්සේ දිගු ගමන්වල යෙදේ.

ස්වයංරැකියාවල නියුක්ත සහ සුළු පරිමාණ ව්‍යවසායකයන්ට තම භාණ්ඩ හා සේවා ප්‍රවාහනය ඉතා අපහසුය. නෙලාගත් අස්වැන්න එදිනෙදා කඩපොළට හෝ සතියේ වෙළඳපොළට හෝ ගෙනයාමට ගොවියෝ මහත් වෙහෙසක් දරති. හෙදියන්, වින්නඹු මාතාවන් වැනි මහජන සෞඛ්‍ය සේවකයන්ට ගෙයින් ගෙට, ගමින් ගමට ඇවිද යාම ඉතා අපහසු කාර්යයකි.

විශේෂයෙන්ම පාසල් දරුවෝ ඉතා දිගු දුරක් පාසැල වෙත පයින් ඇවිද යති. නැවත නිවෙස් කරා ඇවිද එති. මහන්සි වී පාසලට පැමිණෙන එම දරුවන්ට නිසිලෙස අධ්‍යාපන කටයුතු කරගත නොහැකිය. පාසලට පැමිණීම නොකඩවා සිදු කිරීම ඔවුන්ට බොහෝ විට අපහසුය.

දෙපයින් ඇවිද යනවාට වඩා ඉක්මනින් සහ අඩු ශ්‍රමයකින් පාපැදි හරහා ගමනාගමනය කළ හැකිය. එමෙන්ම වැඩි බරකින් යුත් භාණ්ඩ ප්‍රවාහනය කළ හැකිය.

මිලෙන් අඩු වුවත් ඉක්මනින්ම අබලන් වන සාමාන්‍ය පාපැදි එම රළු පොළොවට ඔරොත්තු නොදේ. ඒවා සති කිහිපයක්වත් පවතින්නේ නැත. මෙය ඉතා බරපතල සමාජ සහ ආර්ථික ගැටළුවකි.

මේ තත්ත්වයට එක් ප්‍රධාන හේතුවක් වන්නේ පාපැදි නිෂ්පාදකයන් සහ පාපැදි පාරිභෝගිකයන් අතර හොඳ සම්බන්ධතාවයක් නොමැති වීමයි.

බෆලෝ බයිසිකලස් සමාජ ව්‍යවසාය විසින් මෙම සමාජ ගැටළුව විසඳීම සඳහා ව්‍යවසායි විසඳුමක් ලබා දී තිබේ. එය නම් සිය දක්ෂ නිර්මාණකරුවන් සහ ඉංජිනේරුවන් විසින් අප්‍රිකාවේ රළු පොළොවට ඔරොත්තු දෙන, දිගු කාලයක් පවතින, වැඩි බරක් ගෙන යා හැකි පාපැදියක් නිෂ්පාදනය කිරීමයි.

බෆලෝ පාපැදිය නිර්මාණය කෙරෙන්නේ එය එදිනෙදා භාවිතා කරන පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවය සහ ඔවුන්ගේ ප්‍රතිචාර මතයි. එමෙන්ම සෑම පාපැදියක්ම අනිවාර්ය සහ තදබල තත්ත්ව පරීක්ෂාවන්ට ලක් කෙරේ. බෆලෝ බයිසිකල්ස් කියන පරිදි අප්‍රිකානු මහාද්වීපයේ සවි ශක්තියෙන් වැඩිම පාපැදිය ඔවුන්ගේ බෆලෝ බයිසිකලයයි.

ඔවුන් විසින් පත් කරනු ලබන පාපැදිකරුවන් පිරිසක් විසින් වසර පුරාම බෆලෝ පාපැදි, ඒවායේ උපාංග, ඉදිරියේදී එළිදැක්වීමට නියමිත නිෂ්පාදන අප්‍රිකානු රළු පොළොව මත පරීක්ෂා කර බැලේ. එමගින් ලබා ගන්නා දත්ත සහ තොරතුරු මත බෆලෝ බයිසිකලය නිරන්තරයෙන්ම නව්‍යකරණයට ලක් වේ.

සෑම බෆලෝ පාපැදියක්ම නිර්මාණය කර ඇත්තේ දේශීය වෙළඳපොලේ පහසුවෙන් මිලට ගත හැකි උපාංග වලට ගැලපෙන අයුරිනි. එම නිසා අවම නඩත්තු වියදමකින් වැඩිම කාලයක් බෆලෝ පාපැදි භාවිතා කළ හැකිය. එම නිසා අප්‍රිකාවට සුදුසු හොඳම බයිසිකලය ලෙසත් බෆලෝ බයිසිකලය හැඳින්වේ.

බෆලෝ පාපැදියේ මූලික කොටස් නිෂ්පාදනය කෙරෙන්නේ තායිවානයේය. එම කොටස් අප්‍රිකාවට ආනයනය කර බෆලෝ බයිසිකල්ස් කර්මාන්තශාලාව තුළ, පුහුණුව ලත් සේවකයන් අතින් එකලස් කිරීමෙන් පාපැදි නිෂ්පාදනය කරනු ලැබේ. එමගින් නව රැකියා අවස්ථාද උත්පාදනය වේ.

කෙතරම් ශක්තිමත් වුවත් ඕනෑම පාපැදියක යම්කිසි නඩත්තු කිරීමක් අවශ්‍ය වේ. ඒ සඳහා  සෑම බෆලෝ පාපැදියක් සමගම කුඩා ආයුධ කට්ටලයක් සහ සුළං පොම්පයක්ද පැමිණේ.

එපමණක් නොව, පාපැදි විකිණීම සහ බෙදාහැරීම සඳහාත් ඒවා අලුත්වැඩියා කිරීම සඳහාත් ගම් මට්ටමින් ක්ෂේත්‍ර කාර්මිකයන් පුහුණු කර පත් කර තිබේ. ඒ සෑම කාර්මිකයෙක්ටම පාපැදියක්, ආයුධ කට්ටලයක්, නිල ඇඳුමක්, ප්‍රචාරණ සහ අලෙවිය සඳහා විස්තර පත්‍රිකා ලබා දේ.

කෙන්යාව, උගන්ඩාව, දකුණු අප්‍රිකාව, සැම්බියාව, සිම්බාබ්වේ යන රටවල එවැනි කාර්මිකයයෝ 1,000කට අධික පිරිසක් ස්වයංරැකියාවන් ලෙස බෆලෝ පාපැදි විකුණමින් ඒවා අලුත්වැඩියා කරති.

විවිධ සමාජ සත්කාරක සංවිධාන, මහා පරිමාණ ව්‍යාපාර සහ පරිත්‍යාගශීලීන් බෆලෝ පාපැදි මිලදී ගෙන සිය ප්‍රතිලාභීන් වෙත පිරිනමයි.

බෆලෝ බයිසිකලය පාපැදියක් පමණක් නොවේ. සමාජ ආර්ථික  සවිබලගැන්වීමේ එන්ජිමකි.

(මෙම සමාජ ව්‍යවසාය සත්‍ය උදාහරණයකි. අධ්‍යයන පහසුව සඳහා මෙම උදාහරණයේ යම් යම් වෙනස්කම් සහ උපකල්පන සිදු කර ඇත.)

## පාර්ශවකරුවන් හඳුනා ගැනීම

ඔබේ සමාජ ගැටළුවට, සමාජ කේන්ද්‍රීය විසඳුමට සහ සමාජ ව්‍යවසාය ආකෘතියට අදාළ පාර්ශවකරුවන් මෙම මෙවලම භාවිතයෙන් හඳුනා ගන්න.

මාර්ග පහසුකම් නොමැති වීම නිසා අප්‍රිකානු රටවල ග්‍රාමීය ජනතාවට සිය ව්‍යාපාර, රාජකාරි, අධ්‍යාපන සහ එදිනෙදා වැඩකටයුතු පහසුවෙන් කරගත නොහැකි වීම.




## ගැටළුවට බලපාන හේතු සොයා ගැනීම

මෙම මෙවලම උපයෝගී කර ගනිමින් ඔබ විසඳන හෝ විසඳීමට අදහස් කරන සමාජ ගැටළුවට අදාළ සියලු හේතු හඳුනා ගන්න.

මාර්ග පහසුකම් නොමැති වීම නිසා අප්‍රිකානු රටවල ග්‍රාමීය ජනතාවට සිය ව්‍යාපාර, රාජකාරි, අධ්‍යාපන සහ එදිනෙදා වැඩකටයුතු පහසුවෙන් කරගත නොහැකි වීම.




මෙම මෙවලම භාවිතය සඳහා අවශ්‍ය සම්පූර්ණ උපදෙස් එරන්ද ගිනිගේ විසින් රචිත "සාර්ථක සමාජ ව්‍යවසායකයෙක් වීමට මග" - සමාජ ව්‍යවසායකයන්ගේ අත්පොතෙන් ලබා ගත හැකිය. වැඩිදුර විස්තර සහ උදාහරණ සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

www.socialenterprise.lk/handbook

# සමාජ ව්‍යවසාය ආකෘති පත්‍රය

මෙම මෙවලම භාවිතයෙන් ඔබේ සමාජ ව්‍යවසායයේ ආකෘතිය පහසුවෙන් නිර්මාණය කරගත හැකිය.
ලෝකයේ බහුලව භාවිතා වන මෙවැනි මෙවලම් කිහිපයක් එකතු කර, වැඩි දියුණු කිරීමෙන් මෙම මෙවලම නිර්මාණය කර තිබේ.

## සමාජ ගැටළුව

මාර්ග පහසුකම් නොමැති වීම නිසා අප්‍රිකානු රටවල ග්‍රාමීය ජනතාවට සිය ව්‍යාපාර, රාජකාරි, අධ්‍යාපන සහ එදිනෙදා වැඩකටයුතු පහසුවෙන් කරගත නොහැකි වීම.

ප්‍රවාහන ගැටළුව නිසා පාසල් නොයන දරුවන් පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත

ප්‍රවාහන ගැටළුව නිසා සිදුවන ආර්ථික හානිය පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත

ප්‍රවාහන ගැටළුව නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අකාර්යක්ෂමතාවය පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත

## ප්‍රතිලාභීන්

පාසල් සිසුන්

ස්වයංරැකියා නියුක්තිකයන්

සුළු පරිමාණ ව්‍යවසායකයන්

සෞඛ්‍ය සේවකයන්

## පාරිභෝගිකයන්

පාසල් සිසුන්ගේ දෙමව්පියන්

ස්වයංරැකියා නියුක්තිකයන්

සුළු පරිමාණ ව්‍යවසායකයන්

සෞඛ්‍ය සේවකයන්

සමාජ සත්කාරක සංවිධාන

මහා පරිමාණ ව්‍යාපාර

පරිත්‍යාගශීලීන්

## සමාජ කේන්ද්‍රීය විසඳුම

**අප්‍රිකානු රළු පොළොවට ඔරොත්තු දෙන, සවි ශක්තියෙන් වැඩි, කල් පවතින, වැඩි බරක් ගෙන යා හැකි පාපැදියක් දරා ගත හැකි මිලකට ලබා දීම.**

ඉලක්කගත ප්‍රතිලාභීන්ගේ එදිනෙදා ගමනාගමන සහ ප්‍රවාහන අවශ්‍යතාවය ප්‍රයෝගිකව විසඳීමට හැකි වන්නේ ඔවුන්ට පහසුවෙන් මිලදී ගත හැකි සහ දීර්ඝකාලයක් අඩු වියදමකින් නඩත්තු කළ හැකි ප්‍රවාහන මාධ්‍යයක් ලබා දීමෙනි.

## මූලික ක්‍රියාකාරකම්

අප්‍රිකානු රළු පොළොවට ඔරොත්තු දෙන, සවි ශක්තියෙන් වැඩි, කල් පවතින, වැඩි බරක් ගෙන යා හැකි පාපැදියක් දරා ගත හැකි මිලකට නිර්මාණය කිරීම

එම පාපැදි නිරන්තරයෙන් වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ කිරීම

පාපැදි කොටස් ආනයනය

එකලස් කිරීම

තත්ත්ව පරීක්ෂාව

ප්‍රචාරණය, අලෙවි කිරීම සහ බෙදාහැරීම

සේවකයන් සහ ක්ෂේත්‍ර කාර්මිකයන් පුහුණු කිරීම

මානව සම්පත් කළමනාකරණය

ගිණුම් තැබීම

සමාජ සුබලපෑම මැනීම සහ වාර්තා කිරීම

## අත්‍යවශ්‍ය සම්පත්

දක්ෂ භාණ්ඩ නිර්මාණ ශිල්පීන්

පුහුණුව ලත් සහ උනන්දුව ඇති සේවක සේවිකාවන්

නිසි ප්‍රමිතියට නිෂ්පාදනය කළ පාපැදි කොටස්

එකලස් කිරීමේ කර්මාන්තශාලාව සහ ඒ සඳහා භාවිතා කළ යුතු උපකරණ

ප්‍රචාරණය, අලෙවිකරණය සහ බෙදාහැරීම සඳහා ක්ෂේත්‍ර කාර්මිකයන්ගේ ජාලය

ව්‍යවසාය ආරම්භ කර ලාභ ලබන තත්ත්වයට ගෙන ඒම සඳහා ප්‍රාග්ධනය

## සමාජ සුබලපෑම

පාපැදි භාවිතා කරන සිසුන්ගේ පාසල වෙත පැමිණීමේ ප්‍රතිශතය 80% ක් දක්වා වැඩි වීම. (පාසල් නොපැමිණීමට වෙනත් හේතුද තිබිය හැකිය.)

ස්වයංරැකියා නියුක්තිකයන්, සුළු පරිමාණ ව්‍යවසායකයන් සහ ගොවීන් තම භාණ්ඩ වැඩි ප්‍රමාණයක් කලට වේලාවට පාපැදියෙන් ප්‍රවාහනය කරගැනීම හේතුවෙන් ඔවුන්ගේ මාසික ආදායම 40% කින් ඉහළ යෑම. (භෝග නාස්තිය වැළැක්වීමද මෙහිදී සැලකිය යුතුය.)

සෞඛ්‍ය සේවකයන් පාපැදි භාවිතා කිරීමෙන් මාසයකට පිහිටවන රෝගීන් සංඛ්‍යාව 40% කින් ඉහල යෑම.

ග්‍රාමීය ආර්ථිකය සහ අධ්‍යාපන මට්ටම ඉහළ යෑම නිසා එම ගම්මාන සංවර්ධනය වී එම මිනිසුන් සතුටින් සහ සාමයෙන් කල් ගෙවීම.

## ආදායම් මාර්ග

පාපැදි විකිණීම (සිල්ලර සහ තොග)

පාපැදි උපාංග විකිණීම

## වියදම් ව්‍යුහය

පාපැදි කොටස් ආනයනය

සේවක වැටුප්

කර්මාන්තශාලා නඩත්තු වියදම්

ප්‍රචාරණ, අලෙවි සහ බෙදාහැරීම් වියදම්

ක්ෂේත්‍ර කාර්මිකයන් පුහුණු කිරීම

මෙම මෙවලම භාවිතය සඳහා අවශ්‍ය සම්පූර්ණ උපදෙස් එරන්ද ගිනිගේ විසින් රචිත "සාර්ථක සමාජ ව්‍යවසායකයෙක් වීමට මග" - සමාජ ව්‍යවසායකයන්ගේ අත්පොතෙන් ලබා ගත හැකිය. වැඩිදුර විස්තර සහ උදාහරණ සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

www.socialenterprise.lk/handbook